# ජවිපෙ බෙදීම අපට නම් පුදුමයක් නොවෙයි.

ජනතා විමුක්ති පෙරමුණ තුළ බෙදීම මේ කොළඹ දිගට ම කියවපු උදවියට නම් එතරම් ගැටළුවක් නෙවෙයි. මොකද? දැන් කාලෙක ඉඳලම මේ පක්ෂය තුළ ඇතිවෙන දේශපාලන පිළ් බෙදීම ගැන අප විග්‍රහ කළ හින්ද.

සුළු ධනේශ්වර පක්ෂයකට බලය පිළිබඳ ඉක්මණ් ගමනක් නැතිව කලක් ඉන්නට පුළුවන් කමක් නෑ. විශේෂයෙන් තරුණ කොටස් එක්රැස් කරල බලාපොරොත්තු ඇති කළොත්, ඉක්මණ් බලය සඳහා යන ගමනක් ඒ අයට දෙන්න ඕන.

පසුගිය කාලේ විමල්ගේ දේශහිතෛශී හා මානෙල් මල් ව්‍යාපාර මගින් දුන්නේ පවතින දේශීය රාජ්‍ය ශක්තිමත් කරමින් බලය තහවුරු කර ගැනීමේ මාවතක්.

එය බැලූ බැල්මට හරියන දෙයක් වගේ තමා පෙනුනේ. විමල්ට තිබුණෙත් එවැනි ලොකු සැළකිල්ලක්. හමුදා තුළ පවා සැබෑ පදනමක් ඇති කර ගන්නටත් ඉඩ ලැබුණ. ඒ වගේම නිලධාරි පැලැන්තිය අතරත්, වෘත්තිකයන් අතරත් සෑහෙන පදනමක් ඇති කර ගන්න හැකි වුනා.

මේ රාජ්‍යය තුළම ඇති කරගත් බලය, තහවුරු කර ගනිමින් දේශීය රාජ්‍යයේ මෙහයවීම අතට ගැනීමට යි ඒ අනුව උපා මාර්ග දමා ගත යුතු වන්නේ. ඒක තනිකරම මැද පංතික සිහිනයක්. එයට වැඩ කරන ජනතාව අතර ලොකු පදනමක් ඇති කර ගන්නට බෑ.

දොඩම්පේ මුදලාලිගේ කුමන්ත්‍රණයේ ම හොඳ එක ඇති කර ගන්නට යි විමල්ගේ ගමනින් මඟ පෑදුනේ. ඒත් එවැනි ඇත්ත ගමනක් තියෙනවද? ඒ ගමන මහින්ද රාජපක්ෂ තහවුරු කරමින් යන ගමනක් ඇර වෙන ගමනක්ද?

ඒත් මහින්ද තහවුරු කරමින් යන්නේ දේශීය රාජ්‍යයක් නොවෙයි නේ. එයින් තහවුරු වෙන්නේ ධනේශ්වර රාජ්‍යයේ මර්ධනකාරී ජාතිවාදී නැඹුරුව විතරයි. ඇත්තටම දැන් එය ඒ අනුව සියළු ජන නැගිටීම්වලට විරුද්ධව යොදන යන්ත්‍රයක් බවට තහවුරු වෙමින් තියෙනව.

රනිල් මහත්තයත් දන්නව මේ විදියට ධනපති රාජ්‍ය තහවුරු කර ගැනීම තමන්ටත් ලේසි නැති බව. ඒ දේ මහින්ද ලවා කර ගත්තහම තමන්ගේ ආර්ථික න්‍යාය පත්‍රය ඒ හරහා ගෙනියන්ට හැකි බැව් උන්නැහැහෙට දැන් තේරෙනවා වෙන්න ඕනෑ. ඒ නිසා තමයි රාජ්‍යය සමඟ හැපෙන්නේ නැතිව සිල්ලර සටන් වලට බර දාලා කල් මරමින් ඉන්නේ.

දේශීය රාජ්‍යය තහවුරු කිරීමට මෙයිට වඩා හොඳ වෙන විදිහක් නැති බව විමල්ට පෙනෙන්නට පටන් අරන්. ධනපති පංතිය සමඟ එකතුවෙමින්, ජාතිවාදය යොදා ගනිමින් රාජ්‍යය ශක්තිමත් කර ගැනීමත්, ඊළඟට කම්කරුවන් හා පීඩිත කොටස් මර්ධනය කිරීමත් ඇර වෙන දේශප්‍රේමී සටනක් නෑ.

බටහිර පන්නයට හැඩ ගැහුන මැද පංතික කොටස් පහළට ඇද දමල සිංහල බෞද්ධ මැද පංතිය වඩා හොඳ තැනකට පත් කර ගැනීමේ උපායයක් ඇර මේ දේශීය විප්ලවයන්ට වෙන රාජකාරියක් නෑ. මේක අද ඊයේ වැඩකුත් නෙමෙයිනේ.

එදා 1956 ඉඳලම බමුණු කුලය බිඳ දැමීම දිගින් දිගටම වරින් වර සිද්ධ උනානේ. ඒත් බමුණු කුළය තවම වැටිලත් නෑ. ඉහලට ආපු දේශීය පංතියට වෙච්ච දෙයකුත් නෑ.

වෙච්ච එකම දේ සිංහල ජාතික සංස්කෘතික රාමුවක් තරමකින් ගොඩ නැගීම පමණයි. ඒකත් දේශීය වැඩක් නොවෙයි. හුහක්ම ජාත්‍යන්තර වැඩක්. හුහක් දේවල් එකතු කරල ගොඩ නහාපු දෙයක්.

මේ යුගයේ දේශීය ධනපතියන්ට තනියම ජාතිකත්වයක් ගොඩ නගන්නට බෑ. ඇත්තටම ජාතික හැඳින්වීමක් ඇති කර ගන්නට වාමාංශික බලවේග තමා ඉඩ කඩ හදල දෙන්නේ. මොකද නිර්ධනීන්ගේ මැදිහත්වීම නැතිව ජාතිකත්වයවත් ගොඩනගන්නට ධනපතියන්ට බැරි නිසා.

නිර්ධන පංතිය රටේ බලය ගැනීමට පෙර සමාජ බලයක් ලෙස ගොඩ නැගී දේශපාලන බලයක් ලෙස මතුවෙන කොටම සෑම ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාදාමයක් ම පණ ගන්වන්නට පටන් ගන්නව.

ඒ අනුව ජාතික සංස්කෘතික ක්ෂේත්‍රය තුළත් නිර්ධන පංති දේශපාලන ව්‍යාපාරයේ බලපෑම ඇතිවන එක ස්වාභාවිකයි. මේ අනුව අපට කියන්න වෙනව නිර්ධන පංතිය තම දේශපාලන හයිය තුළින් ජාතික පිබිදීමට උර දීල වැඩ කරල තියෙනව කියල. සිංහල හැඩය ඔප ගැන්වීමට, කලාව ගොඩ නැගීමට නිර්ධන පංතිය මේ විදියට සහභාගී වෙලා තියෙනව.

මේ රට තුළ නිදහස, සමානාත්මතාවය, ප්‍රාජාතන්ත්‍රවාදය, ජාතික හැඳින්වීම, ආදී පැතිවලින් සිද්ධ වෙච්ච සෑම විපර්යාසයකම ලොකුම වැඩ කොටසක් කළේ නිර්ධන දේශපාලන බලවේගය බව කාටත් දැන් පිළිගන්නට සිද්ධවෙලා.

ඒත් මැතදී ජාතිවාදී මැදිහත්වීම් තුළින් වමේ බලපෑම යට ගියා මිසක උඩට ආවේ නෑ. විමල් වීරවංශලා කොයි තරම් උත්සාහ දැරුවත් තමන් සිංහල ජාතික හැඩය ඔප් නැංවීමට ක්‍රියා කරනව කියල ඇත්තට ම කළේ එය වනචාරී අවදියකට ඇදගෙන යෑම යි.

ඇත්තෙන් ම ඊනියා දේශීය ධනපතියන් සමඟ බද්ධ වෙලා කරන්න වෙන්නේ ඕකම තමා. ජාතිවාදී ධනපතියන්ට උවමනා වූ කලාවක් සාහිත්‍යයක් නෑ. උන්ට ඕනා තමන්ගේ වනචර මුදල් බලය පෙන්වීම පමණයි.

දැන් වෙලා තියෙන්නේ විමල් වීරවංශ කල්ලියත් මේ වනචර පුස්සන්ගේ බොරු සෝබනවලට පැටලීම පමණයි. මේ අනුව බැලුවහම එදා "හිරු" පත්‍රය ගහපු ගමලත්ට වඩා අද විමල් බොරු සෝබනවාදියෙක්. දැන් ඉතුරුවෙලා තියෙන්නේ කථා කිරීමේ හැකියාව විතරයි.

ඇත්තටම දේශහිතෛෂී පෙරමුණේ මුළු බල ඇණියම බැටරි බැහැපු කලාකරුවො, හා උගතුන් මිසක, ඉදිරියට ඇවිලෙන බුද්ධිමතුන් නොවෙයි. නිර්ධන පංති ව්‍යාපාරයට හතුරු වෙමින් ඉහළ පැලැන්තිවලට හාමු වෙලා මේ අයට ගොඩ නගන්න පුළුවන් සිංහල ලකුණක් නෑ. සිංහල ජාතියකුත් නෑ. මොකද? තැරැව්කාර පැලැන්තිවලට පුළුවන් තුප්පහි වැඩ මිස ඇත්ත ජාතික වැඩක් බැරි නිසා.

ලංකාව තුළ සිංහල ජාතික ව්‍යාපාරයේ යම් නැගිටීමක් වුනා නම් එය සිදු වුනේ නිර්ධන පංති ව්‍යාපාරයේ බලය උඩයි. 1935 ඉඳලම ජාතික ප්‍රබෝධය නැත්නම් සිංහලේ නැගීම ගැන හොයල බැලුවොත් පෙනෙනව කොයි තරම් බලපෑම් සම සමාජ ය නිසා ඇති වුනාද කියල.

සිංහල කලාවන්ගේ නැගීම හොඳයි කියල අත දුන්නේ, සිංහල බාසාවේ නැගීම හොඳයි කියල අත දුන්නේ නිර්ධනීන්ගේ දේශපාලන ව්‍යාපාරයයි. මොකද? සම සමාජ ව්‍යාපාරය දේශපාලන ව්‍යාපාරයක් වගේම සමාජ ව්‍යාපාරයක් වුනා. එය රහසිගත සටන් සංවිධානයක් හැටියට නොවෙයි ක්‍රියා කළේ. සමාජයම අවුස්සන නිදහස් දේශපාලන ව්‍යාපාරයක් ලෙසටයි එය ක්‍රියා කළේ.

නිර්ධනීන් බලයට එන්න පෙරත්, තම දේශපාලන ව්‍යාපාරයේ හයිය උඩ කලාවේ දිසාව තීන්දු කිරීමටත් මැදිහත් වෙලා තියෙන බව මෙයින් පැහැදිලි වෙනව. විශේෂයෙන්ම ධනපති පංතියට නිදහස් පංතියක් හැටියට නැගී සිටීමට බැරි නම් එම සමාජ වැඩ කොටස කරන්නට නිර්ධනීන්ට නිසඟයෙන්ම සිදුවෙනවා. නිර්ධන පංතික බලයක් පිහිටුවීමට පෙර සිට ම සදාචාරමය මැදිහත් වීමක් තම දේශපාලන ව්‍යාපාරය තුළින් කරන්නට නිර්ධනීන්ට සිදුවුනා.

එම ඉතිහාසයට පිටුපාල ගුණදාස අමරසේකරටවත්, විමල් වීරවංශටවත් කරන්න පුළුවන් ඉටි ගෙඩියක් නෑ.